**ශීර්ෂය 124- සමාජ සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**සමාජ සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
| --- | --- |
| **216** | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |

**2 ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මූළ ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,906,576,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.3,480,192,721 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම පිළිවෙලින් රු.406,437,549 ක් හා රු.19,945,730 ක් හෙවත් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 11.5 ක් හා සියයට 5 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 124 | 3,534,231,000 | 3,127,793,451 | 406,437,549 | 11.5 |
| 216 | 372,345,000 | 352,399,270 | 19,945,730 | 05.4 |
| එකතුව | 3,906,576,000 | 3,480,192,721 | 426,383,279 | 10.9 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12401 | 8,000,000 | 4,110,317 | 3,500,000 | 4,371,503 | 48,000,000 | 17,762,623 |
| 21601 | 18,200,000 | 9,852,283 | 11,200,000 | 14,448,028 | 100,000,000 | 52,356,399 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.182,617ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සමාජ සේවා අමාත්‍යාංශය | 7002/0000/000/0324/0013/000 | 182,575 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 7002/0000/000/0105/0013/000 | 42 |
| එකතුව | | 182,617 |

**2.3.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.4,745,605 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සමාජ සේවා අමාත්‍යාංශය | 6000/0000/0003/0580/000 | 3,230.521 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6000/000/0015/0097/000 | 1,515,084 |
| **එකතුව** | | **4,745,605** |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1. ශීර්ෂය 124 - සමාජ සේවා අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

සමාජ සේවා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන

වාර්තාව 2014 ඔක්තෝබර් 20 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාජ සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 110(1) ප්‍රකාරව හානි ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

### (ආ) විගණන සාක්ෂි නොවීම

බිල්පත්, බෙදාහැරීම් විස්තර, වැඩ නිමවුම් සහතික, ගිවිසුම් පත් ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයේ නොතිබීම නිසා එකතුව රු.1,225,384 කට අදාලවූ ගනුදෙනු 8 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

**--------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2014 ඔක්තෝබර් 15 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.2,087,168,226 ක් විය.

**(ඈ) අයවැය විචලනය**

**-------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 5 ක් සඳහා සළසා තිබුණු රු.3,795,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 61 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**----------------------------------------------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 12401 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.41,530ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු පාලන ගිණුමේ වර්ෂ කිහිපයක සිට පැවැත එමින් තිබුණු රු.1,588 ක ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ii) වටිනාකම රු.233,152 ක් වූ ගිණුම්කරණ වැරදි 2014 මැයි මාසය වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 වත්කම් කළමණාකරනය

**--------------------------**

අමාත්‍යාංශය සතු වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තාව 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් අදාල වාර්තා 2014 ජූනි 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.**

ධීවර අමාත්‍යාංශය සතු වාහන 3 ක් හා ඉඩම් අමාත්‍යාංශය සතු වාහන 3 ක් අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදවා තිබූ අතර එම වාහන පවරා ගැනීමට හෝ ආපසු භාරදීමට හෝ අදාල කටයුතු 2014 මැයි මාසය වන විටත් නිමකර නොතිබුණි.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | 1,831,095 | රු.500,000 කට හා ඊට වැඩි වටිනාකමකින් යුත් අලාභ හානි සම්බන්ධව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු වුවත් වාහන අනතුරක් සම්බන්ධව එසේ කර නොතිබුණි |
| (ii) මුදල් රෙගුලාසි 104(3) | - | වාහන 11 ට සිදුවී තිබුණු අනතුරු 15 ක අලාභ හානි සම්බන්ධව ප්‍රාරම්භක වාර්තා මගින් අලාභය නිශ්චය කර වාර්තා කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104(4) | - | වාහන අනතුරු සම්බන්ධව විධිමත් පරීක්ෂණ මණ්ඩල පත්කොට පූර්ණ |

වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

--------------------------

2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය

| | | | |
|---|---|---|---|
| - | 2 ඡේදය | 540,425 | වාහනය සඳහා සළසා දි තිබුණු ඉන්ධන සීමාව තුළ රාජකාරි අවශ්‍යතා ඉටු කර ගැනීමට කටයුතු නොකර, මාස 06 ක කාල පරිච්ඡේදයක් තුළ අතිරේක ඉන්ධන ලබා ගෙන තිබුණි. |
| - | 4 ඡේදය | 103,126 | 2013 පෙබරවාරි සිට මැයි දක්වා ලේකම්වරිය විසින් ලබාගන්නා ලද අතිරේක ඉන්ධන, ඉන්ධන ලේඛන යේ සටහන් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

-----------------------

2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛයේ

| | | | |
|---|---|---|---|
| - | 2 ඡේදය | 20,317 | චක්‍රලේඛයේ ඇතුලත් නොවූ Peo Tv හා වෙනත් රූපවාහිනී නාලිකා පහසුකම් ලබාගැනීම සඳහා ගෙවීම් කර තිබුණි. |
| - | 3-1 (vi) ඡේදය | 32,913 | නිලධාරියාගේ හෝ කාලාත්‍රයාගේ නමින් නොවන දුරකථන වියදම් ප්‍රතිපූර්ණ කර තිබුණි. |

**(ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ**

---------------------------

2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛයේ

| | | | |
|---|---|---|---|
| - | 3 ඡේදය | ඇමරිකානු ඩොලර් 255 | වැඩ සටහනට අදාල සියලු වියදම් ප්‍රධායක ආයතනය ගෙවීමට බැදී සිටියදී අනියම් දීමනා ලෙස දිනකට ඩොලර් 30 බැගින් දින 8½ ක් සඳහා ගෙවා තිබුණි |
| - | 7 ඡේදය | ඇමරිකානු ඩොලර් 500 | අධ්‍යයන වැඩමුළුවක සහභාගි වූ කණ්ඩායමක කණ්ඩායම් නායකයා |

| | | | |
|---|---|---|---|
| | | | ලෙස කටයුතු කිරීම වෙනුවෙන් හිමිකම් නොමැති නිලධාරියෙකුට ඩොලර් 500 ක් ගෙවා තිබුණි. |
| - | 5(i) ඡේදය | ඇමරිකානු ඩොලර් 630 | විදේශ ආයතනය විසින් ප්‍රවාහන වියදම් රාජ්‍ය ගාස්තු හා නේවාසිකාගාර වියදම් දැරීමට එකඟ වී තිබියදී දින 21 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) කාලපමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 124-2-5-16-2502(13) දරන වැය විෂය යටතේ ප්‍රතිපාදන සළසා තිබුණු දිරි සවිය ව්‍යාපෘතිය 2013 ජනවාරි සිට මාර්තු දක්වා ක්‍රියාත්මක නොවීම හා ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබාදීමේ කටයුතු වර්ෂය තුළ ආරම්භ නොකිරීම නිසා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.4,000,005 ක් හෙවත් සියයට 34 ක් ඉතිරිවී තිබුණි.

(ii) අමුණුකුඹුර හා තෙලඹුයාය ආබාධ සහිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණු ආයතනවල ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා 124-2-5-2104 දරන වැය විෂය යටතේ රුපියල් මිලියන 76 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එහි වැඩකටයුතු ප්‍රමාදවී සමාලෝචිත වර්ෂය අවසානයේදී ආරම්භකර තිබුණි.

### (ආ) මුදල් නිදහස් කර තිබුණද අපේක්ෂිත කාර්ය සාධනය ඉටුනොවූ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි දීමනා ගෙවීම සඳහා ක්‍රියාවලීන් 03 ක් අනුගමනය කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දීමනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පැවති විවිධ දුර්වලතා හේතුවෙන් වැඩිහිටියන් වෙත රු.151,021,529 ක් වූ දීමනා ගෙවා නොතිබුණි.

(ii) 2013 මාර්තු හා අප්‍රේල් මාසයන්ට අදාලව වැඩිහිටි දීමනා ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.321,360,000 ක් ලබා දී තිබුණද, එම මුදලින් වැඩිහිටියන් වෙත ගෙවා තිබුණු මුදල, නොගෙවා ඉතිරි වූ මුදල හා මාස දෙකක කාල පරිච්ඡේදයට අදාලව ගෙවිය යුතු වැඩිහිටි දීමනාව කොපමණද යන්න අමාත්‍යාංශය විසින් හඳුනාගෙන නොතිබුණි.

(iii) 2013 මාර්තු හා අප්‍රේල් මාසවල වැඩිහිටි දීමනා ලෙස නොගෙවූ මුදල් නැවත අමාත්‍යාංශයට ප්‍රේෂණය කළ යුතු බව දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 24 ක් එසේ කටයුතු කර නොතිබුණි. 2013 මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වැඩිහිටි දීමනා ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිකුත් කළ ප්‍රතිපාදනවලට අදාලව සත්‍ය වශයෙන්ම ගෙවීම කරනු ලැබූ මුදල හා දීමනා ලාභීන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දැක්වෙන පරිදි සාරාංශ වියදම් වාර්තා අමාත්‍යාංශයට එවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකළ අවස්ථා විය.

## 1.7 කාර්යසාධනය

------------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සමඟ එකඟ නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012-2016 කාලපරිච්ඡේදයට අදාලව පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි ආබාධිත අයිතිවාසිකම් පිළිබඳ නව පනත, ජාතික උපදේශන පනත හා මුද්‍රා භාෂා පනත සම්මත කර ගැනිම අමාත්‍යාංශයෙහි අරමුණු යටතේ සඳහන් කර තිබුණත්, එම පනත් කෙටුම්පත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ii) සංයුක්ත සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ඉටු කළ යුතු වූ අබාධිත සභාවට අදාල වැඩසටහන් 05ක් ඇතුළත්ව නොතිබුණත්, ක්‍රියාකාරී සැලසුමෙහි එය අන්තර්ගත කර තිබුණි.

(iii) 124-2-5-12-2502(13) හා 124-2-5-16-2502 දරන වැය විෂයයන් යටතේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හා ශ්‍රී ලංකා රජය අතර ඇති ආධාර වැඩසටහන

හා ආබාධිතයන් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා එකතුව රු.124,300,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද එම වැඩසටහන් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමෙහි ඇතුළත් කර නොතිබුණි.

(iv) වාර්ෂික ඇස්තමේන්තුවෙහි හා ක්‍රියාකාරී සැලසුමෙහි සමාජ සංවර්ධන කළමනාකරණ තොරතුරු පද්ධතිය සැකසීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එය සංයුක්ත සැලසුමෙහි ඇතුළත්ව නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්තිය යන මැයෙන් සමාජ සේවා ඇමතිතුමා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2012 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ආර්ථික, සාමාජීය හා අධ්‍යාත්මික වශයෙන් පවුල සවිබල ගන්වමින්, සමාජයේ මූලික ඒකකය වශයෙන් එය ශක්තිමත් කිරීම පිණිස වඩාත් පුළුල් රාමුවක් සහිත පවුල් ප්‍රතිපත්තියක්, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සහ සෙසු පාර්ශවයකරුවන් විමසමින් සකස් කර ඒ අනුව පවුල් ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම මාස 02 ක් ඇතුළත ඇමතිතුමා මාර්ගයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය සමාලෝචිත වර්ෂය අවසාන වනව විටත් නිම කර නොතිබුණි.

(ii) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනු ස්වඋපකාර වැඩසටහන් 366 ක් හා සංඥා භාෂා වැඩසටහන් 25 ක් පැවැත්විමට සැලැසුම් කර තිබුණද ස්වඋපකරණ වැඩ සටහන් 115 ක් හා සංඥා භාෂා පුහුණු වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

**(ඇ) ප්‍රගති වාර්තාවලින් සත්‍ය භෞතික හා මූල්‍ය කාර්යසාධනය ඉදිරිපත් නොකිරීම**

(i) සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවට අදාලව ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාවෙන් පෙන්වා දී තිබූ භෞතික හා මූල්‍ය කාර්යසාධන මට්ටම සත්‍ය කාර්යසාධන මට්ටම හා නොසැසඳුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| වැඩසටහන | සැලසුමට අනුව අපේක්ෂිත ප්‍රමාණය | | ප්‍රගති වාර්තාවේ අනාවරණය කිරීම | | සත්‍ය ප්‍රමාණය | | ප්‍රගති වාර්තාව හා සත්‍ය ප්‍රමාණය අතර වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|
| CBR වැඩසටහන | භෞතික | මූල්‍ය රු. | භෞතික | මූල්‍ය රු. | භෞතික | මූල්‍ය රු. | භෞතික | මූල්‍ය රු. |
| කොමඩ් ටොයිලට් | 75 | 2,000,000 | 47 | 2,111,000 | 65 | 271,336 | 18 | 1,839,664 |
| වතුර මෙට්ට | - | | 14 | | 06 | | 08 | |
| ප්‍රවේශ පහසුකම් | 25 | | 13 | | 06 | | 07 | |
| විදුලි පහසුකම් | - | | 11 | | 03 | | 08 | |
| වෙනත් පහසුකම් | 25 | | 23 | | 41 | | 18 | |
| සිසුණැන පුබුදුව වැඩසටහන | | | | | | | | |
| ස්වේච්ඡා නායකයින් | 160 | 8,000,000 | 466 | 8,000,000 | 514 | - | 48 | - |
| පොත් මිලදී ගැනීම | 4000 | 9,000,000 | 5445 | 9,000,000 | 7180 | 1,299,102 | 1735 | 7,700,898 |
| තනි මාපිය ක්‍රමය | | | | | | | | |
| තනි මාපිය ක්‍රමය යටතේ ස්වයං රැකියා | 535 | 5,350,000 | 621 | 5,875,000 | 674 | 6,311,000 | 53 | (436,000) |
| කුඩා කණ්ඩායම් සඳහා ආධාර ලබාදීම. | 25 | 1,025,000 | 18 | 1,025,000 | 10 | 630,000 | 08 | 395,000 |
| ස්වයං රැකියා පුහුණු වැඩසටහන | 08 | 400,000 | 06 | 100,000 | 06 | 77,860 | - | 22,140 |

(ii) ස්වෙච්ඡා සේවක වැඩමුළු, ප්‍රජානායකයින් සඳහා වැඩමුළු හා ස්වශක්ති කණ්ඩායම් පිහිටුවීමේ වැඩමුළු පිළිබඳව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ලඟා කරගත යුතු ඉලක්ක ලෙස පුද්ගල සංඛ්‍යාව දක්වා තිබුණු අතර, ප්‍රගති වාර්තාවල පවත්වා තිබුණු වැඩසටහන් ගණන වශයෙන් සඳහන් කර තිබීම නිසා අපේක්ෂිත ප්‍රගතිය සැසදීමට නොහැකි විය.

(iii) ආධාර උපකරණ ලබාදීමට රු.1,839,664 ක් වැය කර තිබුණු අතර ප්‍රගති වාර්තාවල එය රු.2,111,000 ක් ලෙස රු.271,336 ක ප්‍රමාණයක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව වැඩියෙන් දක්වා තිබුණු මුදල වැය කළ මුදලින් සියයට 14.7 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ක්‍රියාකාරි සැලැසුම මගින් ප්‍රගතිය අධි තක්සේරු කිරීම**

2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ දැක්විය යුතු ඉලක්ක අඩුකර පෙන්වීමෙන් 2013 වර්ෂයේ දිස්ත්‍රික් කමිටු රැස්වීම්වල ප්‍රගතිය සියයට 56 කින්ද, පළාත් සහායක නිලධාරී වැඩ මුළු ප්‍රගතිය සියයට 100 කින්ද, මූලික කණ්ඩායම් ප්‍රගති සමාලෝචන රැස්වීම්වල ප්‍රගතිය සියයට 316 කින්ද වැඩියෙන් දක්වා තිබු බව නිරීක්ෂණය විය.

| | විස්තරය | වර්ෂය තුළ පැවැත්විය යුතු වැඩමුළු/ රැස්වීම් ගණන | ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබූ ඉලක්ක ගත වැඩ මුළු රැස්වීම් ගණන | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් කමිටු රැස්වීම් (දිස්ත්‍රික් 25 තුළ කාර්තුවකට රැස්වීම බැගින් (25x4) | 100 | 64 | 36 | 56 |
| (ii) | පළාත් සහයක නිලධාරී වැඩ මුළු (මාසයකට 1 බැගින්) | 12 | 06 | 06 | 50 |
| (iii) | මූලික කණ්ඩායම් ප්‍රගති සමාලෝචන රැස්වීම් (දිස්ත්‍රික්ක 25 තුළ මාස 06 කට 1 බැගින් | 50 | 12 | 38 | 316 |

**(ඉ) ඇස්තමේන්තු සැකසීමේ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ ස්වේච්ඡා නායකයින් 160 ක් පුහුණු කිරීම සඳහා රු.800,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව එක් නායකයෙකු වෙනුවෙන් රු.5,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2013 වර්ෂයේදී රු.800,000 ක් වැය කර ස්වේච්ඡා නායකයින් 466 දෙනෙකු පුහුණු කර තිබුණි. ඒ අනුව සත්‍ය ලෙස එක් නායකයකු පුහුණු කිරීමට රු.1,717 ක් පමණක් වැය කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ සිසු නැණ පුබුදුව කියවීමේ මධ්‍යස්ථාන 20 ක් ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණු බැවින් එක් මධ්‍යස්ථානයක් සඳහා අවම වශයෙන් ස්වේච්ඡා නායකයින් 15 බැගින් 300 ක් පුහුණු කළ යුතු වුවත්, පුහුණුවට සැලැසුම් කර තිබුණේ 160 දෙනෙකු පමණි.

## 1.8 නිෂ්කාර්යව වෙනත් පාර්ශවයන් වෙත රැඳී පැවති මුදල්

2012 නොවැම්බර් සිට 2013 පෙබරවාරි දක්වා වැඩිහිටි දීමනා ගෙවීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගිණුම් කාර්යාල 14 ක් වෙත ලබාදුන් මුදලින් රු.81,055,800 ක වැඩිහිටි දීමනා ලෙස නොගෙවා මාස 03 ත් මාස 10 ත් අතර කාලයක් ගත වී තිබුණත්, ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2011 ජුනි 16 දින සිට 2013 ජුනි 18 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශය සතු වාහනයක් ආසන්න වශයෙන් කිලෝමීටර් 85,000 ක් ධාවනය කර තිබුණි. එම කාල පරිච්ඡේදයට අදාලව එම වාහනයේ අළුත්වැඩියා වෙනුවෙන් රු.561,943 ක් වැය කර තිබුණි. ඒ අනුව එක කිලෝ මීටරයකට අළුත් වැඩියා වියදම රු.6.61 ක් වැනි ඉහළ වියදමක් අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණි.

(ආ) 2012 නොවැම්බර් 22 දින කොළඹදී අනතුරට පත් වූ අමාත්‍යාංශය සතු වාහනයක එම අනතුරෙන් සිදු වි ඇති පාඩුව ගණන් බලා නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව 2013 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතු වාහනයකට වෙනත් වාහනයක් පිටුපසින් පැමිණ ගැටීමෙන් අනතුරට ලක්වී තිබුණත් රජය සතු වාහනයට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) අතිරේක ඉන්ධන සඳහා හිමිකම නොමැති වූවත්, අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකු මාසික ඉන්ධන දීමනාවට අමතරව රු.175,294 ක අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි.

(ආ) සමිතියක් වෙනුවෙන් අවස්ථා 05 කදී රු.2,685,468 ක් වටිනා කෘතිම පාද නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා තීරු බදු සහන ලබාදී තිබූ අතර එම සහන ලබාදීමේදී අදාළ අයිතම බෙදාහැරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතේ සිදුකරන බව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට දන්වා තිබූ නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අවදානම් සහිත පවුල්වල ජීවනෝපාය ඉහල නැංවීම සඳහා ස්වයං රැකියා අවස්ථා වැඩසටහන යටතේ හඳුනාගත් එක් පවුලක් සඳහා ගෙවිය හැකි උපරිම ආධාර මුදල රු.25,000 ක් වුවත්, මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 08 ක් වෙත රු.40,000 බැගින් එකතුව රු.320,000 මුදලක් ගෙවා තිබුණි.

(ඈ) සංවිධානයක් විසින් සමාජ සේවා අමාත්‍යාංශයට එවන ලද පරිත්‍යාග තොගය නිදහස් කර ගැනීම සඳහා රු.602,714 ක් වැය කර තිබුණු අතර නැවත එම භාණ්ඩවලින් කොටසක් එම සංවිධානය වෙත ආපසු භාරදී තිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ වාහන සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.378,130 ක් එම අරමුණ සඳහා වැය නොකර වාහන නඩත්තුව සඳහා වැයකර තිබුණි.

(ඊ) වාහන අළුත්වැඩියාවලදී රියදුරු විසින් කරනු ලබන ඉල්ලීම මත කාර්මික නිලධාරියෙකු විසින් පරීක්ෂා කර බලා නිර්දේශ කළ පසු විධිමත් ආකාරයට අළුත්වැඩියාව සඳහා සුදුසු ගරාජයකට භාරදී අළුත්වැඩියාවෙන් පසු නියමිත පරිදි අළුත්වැඩියාවන් කළ බවට කාර්මික නිලධාරියෙකු විසින් නිර්දේශ කිරිමෙන් අනතුරුව ගෙවීම් කළයුතු වුවද, එසේ නොකර සම්බන්ධීකරණ ලේකම්ගේ නිර්දේශය මත අවස්ථා 26 කදී රු.592,606 ක් ගෙවා තිබුණි.

(උ) 2012 වර්ෂයේදී අනතුරට පත් වාහනයක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය නොකර පෞද්ගලික ගරාජයක එය තැබීම නිසා රු.164,400 ක බිම් කුලියක් හා රු.30,000 ක අමතර ප්‍රවාහන ගාස්තුවක්ද ගෙවා තිබුණි.

(ඌ) කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) සෙත්සිරිපායේ අදියර 11 හි පළමු මහලේ A,B හා D කොටසේ සමාජ සේවා අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල කාර්යාල බෙදා වෙන්කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.17,560,306 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 10 ඉක්මවන ඕනෑම වැඩ කොන්ත්‍රාතුවක් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගත යුතු වුවත් සීමිත මිල ගණන් කැඳවා තිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනවල අදාල අන්තර්ගතය පරිපූර්ණව දක්වා තිබිය යුතු වුවද, අදාල පිරිවිතරයන් හා ප්‍රමාණ පසු ලංසු කැඳවීමේ ලේඛන වල ඇතුළත්ව නොතිබුණි.
- මිණුම් වාර්තා රහිතව රු.17,560,306 ක් ගෙවීම හේතු කොටගෙන පෞද්ගලික ආයතනයකට රු.2,663,949 ක් වැඩිපුර ගෙවා තිබුණි.
- 2013 අගෝස්තු 28 දින ලංසු කැඳවීමට පෙර පැවැත්වෙන රැස්වීම්වලට අවිධිමත් ලෙස කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු පමණක් සහභාගි කරගෙන තිබුණි.
- තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් කර තිබුණු නිලධාරීන් පස්දෙනා කාර්යාල බෙදා වෙන්කිරීම පිළිබඳ විෂය දැනුමක් රහිත නිලධාරීන් විය.
- තාක්ෂණික කමිටුවේ විෂය විශේෂඥයා ලෙස පත්කර තිබූ පුද්ගලයා රජයේ කර්මාන්ත ශාලාවෙන් පූර්ණකාලීනව නිදහස් කරවාගත් යාන්ත්‍රික අධිකාරිවරයෙකු විය.
- මිල ගණන් කැඳවීමේදී ජිප්සම් බෝඩ් (Gypsum board) පාටිෂන් සඳහා වර්ග අඩියකට රු.310 බැගින් වර්ග අඩි 3396 ක් සඳහා රු.1,052,784 ක් ගෙවා

තිබුණද ඒ සඳහා මිල ගණන් කැඳවීමක් කර නොතිබුණි. තරඟකාරී ලංසු කැඳවීමක් කර නොතිබූ බැවින් අවම මිලකට වැඩය ඉටුකර ගැනීමේ අවස්ථාව අහිමිවී තිබුණි.

- 2014 මාර්තු 03 දින ප්‍රසම්පාදන කමිටු තීරණය මඟින් රු.13,388,510 ක එකතු කළ අගය මත බදු රහිත වටිනාකමකට ඉටුකිරීමට ගිවිසුම් බැඳී තිබූ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.15,799,700 ක් දක්වා රු. 2,411,199 ක අමතර ගෙවීමක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාදී තිබුණද එම අමතර ගෙවීම් වටිනාකම තීරණය කර අනුමත කිරීමේදී කොන්ත්‍රාත්තුවේ කාර්යයන්ගේ ප්‍රමාණයන් පිළිබඳ හා ගෙවීම් කරන ලද ඉන්වොයිස් හා ප්‍රසම්පාදන ලියවිලි සඳහන් තොරතුරු පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ii) සෙත්සිරිපාය අදියර ii හි පළමු මහලේ C කොටසේ අංශ බෙදා වෙන් කිරීම හා කාපට් දැමීමේ කාර්ය සඳහා රු.1,440,290 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොන්ත්‍රාත්කරු තෝරාගත් ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවිණි.
- අංශ බෙදා වෙන්කිරීමේ සැලැස්මක් නොතිබුණි.
- විවිධ මාදිලියේ පාටිෂන් වර්ග වල මිල ගණන් වෙන් වෙන්ව කැඳවා නොතිබුණි.
- සුදුසුකම් ලත් කාර්මික නිලධාරියෙකුගේ හා උපදේශන සේවා ලබාගෙන නොතිබුණි.
- විවිධ මාදිලියේ පාටිෂන් වර්ගවල මිල ගණන් නොසළකා ගෙවීම් කිරීම හේතුවෙන් රු.793,039 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
- කාපට් ඇතිරීමට අදාල වර්ග අඩි 131.5 ක් සඳහා රු.221,831 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ගරු ඇමතිතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලවල රු.206,000 ක වියදමක් කර ඉදිකර තිබුණු පැන්ට් කබඩ් 2014 ඔක්තෝබර් වන විටත් අබලන් තත්ත්වයට පත්වී තිබුණි.

## 1.11 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අනතුරට ලක් වූ වාහනයක් සඳහා රු.1,831,095 ක අළුත්වැඩියා වියදමක් දරා තිබුණු

අතර, ඒ සඳහා රක්ෂණ සංස්ථාවෙන් ලැබූ මුදල රු.1,380,756 ක් විය. මේ අනුව රු.450,338 අලාභහානිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර් රථයකට සිදු වූ අලාභය රු. 4,700,000 ක් වූ අතර මෙම මුදල මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.12 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේදී රිය අනතුරට ලක්වූ වාහනයට සිදුවූ හානිය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වීමට 2013 වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) වැඩිහිටි දීමනා ගෙවීම් ක්‍රමයේ පවතින පහත සඳහන් දුර්වලතාවයන් විගණන අවස්ථාව වනවිටත් නිවැරදි කරගෙන නොතිබුණි.

(i) වැඩිහිටි දීමනාව ලබන නිවැරදි ප්‍රතිලාභීන් පිළිබද දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් සැකසීම.

(ii) වියදම් වාර්තා හා අදාල සංඛ්‍යාලේඛන යාවත්කාලීනව හා අප්‍රමාදව ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙල.

(iii) ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන්, දිසා ගිණුම් කාර්යාලවල, තැපැල් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොගෙවා ඉතිරිව පවතින මුදල් පවතීනම් එම මුදල් අප්‍රමාදව ගෙන්වා ගැනීමට කටයුතු කිරීමේ වැඩපිළිවෙල

(iv) දිසා ලේකම් කාර්යාලවලට යවන ලද ප්‍රතිපාදන, වියදම, අධිභාර හා නොගෙවූ දීමනා සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම.

(ඇ) මන්නාරම් තිරුකේදීෂ්වරම් වැඩිහිටි නිවාසය ඉදිකිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩු පාඩු නිරීක්ෂණය විය.

(i) වැඩිහිටි නිවාසය ඉදිකිරීම සඳහා ගොඩනැගිල්ල සැලැසුම් කිරීමේදී ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට එය සකස් කිරීමට උපදෙස් දී නොතිබුණි.

(ii) ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2010 වර්ෂය අවසාන වනවිට රු.18,118,242 ක්

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබූ අතර තවදුරටත් ගෙවිය යුතු රු.4,811,243 ක මුදල් ප්‍රතිපාදනයක් නැවත පදිංචිකිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට ලබාදී තිබුණද, නියමිත කාලවකවානුව තුළ එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම, සැලසුමට අනුව අඩුපාඩු නිවැරදි කර ගැනීමේ කටයුතු හා හිඟමුදල් ගෙවීම් සම්බන්ධව කළමණාකාරීත්වය සැලැකිලිමත් වී නොතිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 10 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 410 | 245 | 165 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 48 | 04 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| | **එකතුව** | **483** | **308** | **175** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 175ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

සමාජ සේවා අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයට අයත් අමාත්‍යාංශයෙන් වැටුප් ලබන නිලධාරින් දෙදෙනෙකු සමාජ සේවා දෙපාර්තමේන්තුවේ හා වැඩිහිටි ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරයි.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**-----------------------------------------------------**

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 02 දෙනෙකු හා වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු දෙපාර්තමේන්තුවේන් හා වැඩිහිටි ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබමින් අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරයි.

**2. ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------------

**2.1 විගණන විෂය පථය**

**--------------------**

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 13 දින සමාජ සේවා අධ්‍යක්ෂක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර

පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446(3) |
| (iiii) | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ දුරකථන රෙජිස්ටරය | මුදල් රෙගුලාසි 845 |

### (ආ) විගණන සාක්ෂි නොවීම

මිල කැඳවීම ලිපි, මෙවලම් කට්ටල ලබාගත් බවට තහවුරු කිරීම, අත්සන් සහතික , බැංකු පොත්, මුදල් තැන්පතු ,මුදල් ලබා දුන් බවට ලිඛිත තහවුරු කිරීම්,මිලදී ගැනීම්වලට අදාල තොරතුරු, අත්සන් ලේඛන, වියදම් ඇස්තමේන්තුව ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම නිසා එකතුව රු.5,452,162 කට අදාලවූ ගනුදෙනු 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**(ඇ) අයවැය විචලනය**

**--------------------**

**ප්‍රතිපාදන ඉතිරිවීම්.**

**----------------------**

වැඩසටහන් 01 හා 02 හි පුනරාවර්තන වැය විෂයයන් 6 කට හා ප්‍රාග්ධන වැය විෂයයන් 05 කට අධි ප්‍රතිපාදන සැලැසීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂයන්ට අදාළව ශුද්ධ ප්‍රතිපාදනයෙන් පුනරාවර්තන වැය විෂයයන්වල සියයට 8 සිට සියයට 35 ක දක්වා වූ පරාසයක හා ප්‍රාග්ධන වැය විෂයන්වල සියයට 7 සිට සියයට 67 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 21601 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.330,444 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දෙපාර්තමේන්තු පොත්වල කේවල ශේෂ වර්ගීකරණය සාරාංශයේ එකතුව රු.52,417,605 ක් වූ අතර දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.52,356,399 ක් වූ බැවින් රු.61,206 ක වෙනස ක් අනාවරණය වී තිබුණත්, 2014 ජුලි 30 දින වන විටත් එයට හේතු වූ කරුණු හඳුනාගෙන නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය නිලධාරින් 04 දෙනෙකුගේ වර්ෂ 02 සිට වර්ෂ 12 ක කාල පරාසයකට අයත් එකතුව රු.314,723 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේදී නිලධාරින්ගේ 17 දෙනෙකුගෙන් එකතුව රු.8,610 ක් වූ ණය වාරික වැඩිපුර අයකරගෙන තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| (i) | කණ නොඇසෙන ළමුන්ගේ මූලික ශ්‍රවන පරීක්ෂණ යන්ත්‍රය. (Peretone Audiometry machine) | 1 | 10 |
| (ii) | රුධිර පීඩන යන්ත්‍රය. | 1 | 10 |
| (iii) | වෝකර් | 02 | 02 කට වැඩි |
| (iv) | රෝද සහිත වෝකර් | 126 | 05 කට වැඩි |
| (v) | මහන මැෂින් (අලුත්) | 15 | 01 කට වැඩි |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කැටවල ලෙව්ල වෘත්තීය පුහුණු ආයතනයේ භාණ්ඩ වගී 536 ක අයිතමයන්

2202 කද, ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ වර්ග 40 ක අයිතම 163 කද, සීදූව වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ භාණ්ඩ වර්ග 246 ක අයිතම 1062 කද, ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 හා 108 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) ආයතන 03 ක භාණ්ඩ වර්ග 22 ක අයිතමයන් 164 ක අතිරික්තතා නිරීක්ෂණය විය.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

---

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයකට අදාල බැරකම් රු.8,390,148 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳිය නොහැකි වූවද, වැය විෂයන් 20 ක ප්‍රතිපාදන ඉක්මවා රු. 6,269,600 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ii) වැය විෂයන් 8 ක බැරකම්වල වටිනාකම, බැරකම් ලේඛණය සමඟ රු.962,633 කින් නොසැසඳුණි.

(iii) බැරකම් සම්බන්ධව ආයතන 02 කින් ලැබූ ශේෂ සනාථ කිරීම් අනුව රු.154,142 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(iv) වැය විෂයන් 09 ක බැරකම් වටිනාකම් හා වවුචර් අනුව බැරකම්වල වටිනාකම් අතර රු.198,636 ක වෙනසක් විය.

**2.5 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | 123,354 | විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරි 02 දෙනෙකුගේ වර්ෂ 05 ඉක්ම වූ |

| | | | |
|---|---|---|---|
| | | | ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. |
| (ii) | XXIV පරිච්ඡේදයේ 4.4.1 , 4.5 හා 4.6 වගන්ති | 293,570 | වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු වර්ෂ 03 -05 අතර කාල පරාසයක් ඉක්මවූ ණය ශේෂයන් අයකර ගෙන නොතිබුණි. |
| (iii) | XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තිය | - | නිලධාරින් 09 දෙනෙකුගේ 2013 වසර ආරම්භයේ උත්සව අත්තිකාරම් අයකිරීමට මාස 06 - 09 කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 245(2) | - | වවුචර් අනු පිටපත්වල අනුමත කිරීම සිදු කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 316(අ) | - | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ අග්‍රිම මුදල් ආරක්ෂක පෙට්ටියක දමා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371 (ආ) | 33,000 | අත්තිකාරම් කාර්ය නිමවූ විගස පියවිය යුතු වුවත් නිලධාරීන් 03 දෙනෙකු වෙත අවස්ථා 03කදී ලබාදුන් අත්තිකාරම් පියවීම දින 11ත් මාස 02 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 756 හා 757 | - | වාහන පිළිබඳව සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1645 | - | ක්‍රමවත් හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 1645(ආ) | - | රියදුරා ලවා 268 වැනි පොදු ආකෘති පත්‍රයේ ප්‍රකාරව දෛනික ධාවන සටහන් තබා ගැනීමට සලස්වා පරිපාලන |

| | | | |
|---|---|---|---|
| | | | නිලධාරීන් ලවා එය නීතිපතා පරීක්ෂා කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 1646 | - | මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 1647(3) හා මුදල් රෙගුලාසි 802 | - | වාහන ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය 2.11 ඡේදය | - | සෑම මාස 06 කට වරක්ම ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 | - | සංචිත වාහනයක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |

(ඈ) **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ**

**------------------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 2001 ජූලි 02 දිනැති අංක 2001/03MF/GA2/ චක්‍රලේඛය | - | පුහුණුව හා විදේශ සංචාරයට සහභාගී වී පැමිණි දිනසිට සති 02 ක් ඇතුලත අදාළ පුහුණුව/ විදේශ සංචාරයට අදාල වාර්තා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතු වුවත් 2010 වර්ෂයේ අගෝස්තු සිට 2013 ජූලි දක්වා විදේශ ගත වූ නිලධාරීන් 20 දෙනෙකු විසින් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 2010 ඔක්තෝබර් 11 දිනැති චක්‍රලේඛ අංක 01/2010/01 හි 3(iii) ඡේදය | 588,915 | අධ්‍යයන හෝ පුහුණුව සඳහා විදේශ ගත වන අවස්ථාවකදී අනියම් දීමනාව විදේශ රජය හෝ ආයතනය නොගෙවන විටදී පමණක් එක් දිනකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 30 |

බැගින් උපරිම දින 30 ක් සඳහා ගෙවිය හැකි බව දක්වා ඇතත් නිලධාරීන් 11 දෙනෙකුට විදේශගතව සිටින දිනවලදී අදාල වියදම් දරන බව දන්වා තිබියදී අනියම් වියදම් ගෙවා තිබුණි.

**(ඉ) දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා ලිපි**

---

| | | |
|---|---|---|
| (i) සමාජ සේවා අධ්‍යක්ෂකගේ 2011 සැප්තැම්බර් 19 දිනැති අංක SS/4/1/1-1 ලිපියේ 03 ඡේදය | - | ආයතනයේ අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගීවී නොතිබුණු අතර ආයතන 02ක තෝරා ගන්නා ලද අභ්‍යාසලාභින්ගේ නම් හා වෙනත් අදාළ තොරතුරු ඇතුළත් ලේඛනය අනුමැතිය සඳහා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 1998 ජුනි 22 දිනැති අංක 385 දරන චක්‍රලේඛයේ | | |
| - 02 ඡේදය | - | දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබන, සුබිත කාන්තා වෘත්තීය පුහුණු ආයතනයේ පුහුණුව ලබන අභ්‍යාසලාභීන්ගේ ආබාධිතභාවය තහවුරු කිරීම සඳහා අදාල වෛද්‍ය වාර්තා ලැබී නොතිබුණි. |
| - 03 ඡේදය(V) | - | ආබාධිත වූවන් සඳහා පැවැත්වෙන පාඨමාලා පිළිගත් විෂය නිර්දේශයන් අනුව සකස් කර සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ස්වේච්ඡා ආයතන 10ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 2011 සැප්තැම්බර් 19 දිනැති අංක SS/4/1/1-1 දරණ ලිපියේ 7 ඡේදය | - | අභ්‍යාසලාභී දීමනා ගෙවීම් වලට අදාලව සියළුම වවුචර් පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාජ සේවා නිලධාරීන්ගේ වාර්තාවද සමග ප්‍රාදේශීය |

ලේකම් මඟින් මාසිකව ඉදිරිපත් කලයුතු වුවත් ආයතන 04ක දීමනා වවුචර් පත් එසේ ඉදිරිපත් කර නොතිබුණු අතර ප්‍රමාද කාල පරාසය මාස 02 ත් 07ත් අතර පැවතුණි.

**2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**-----------------------------------------**

**මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**--------------------------------------------------------------**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ආබාධිත තරුණ තරුණයන් සඳහා පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මූල්‍යාධාර සැපයීමේ වැඩ සටහන යටතේ පහත සඳහන් පරිදි 2012 හා 2013 වර්ෂ වලදී ලද රු.729,050 ක මුදලින් රු.713,289 ක මුදලක් 2014 මාර්තු විගණන අවස්ථාව වන විටත් අදාල අරමුණු කරා යෙදවීමකින් තොරව පොදු තැන්පත් ලෙජරයේ රඳවාගෙන තිබුණි. මේ සඳහා ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.7 කාර්යසාධනය**

**---------------**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්**

**------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් ලෙස ඉටුනොකරන ලද කාර්යන් කිහිපයක් පහත දැක්වේ.

(i) ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ ආරම්භක අවස්ථාව වූ 2003 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව වු 134 හා සසඳන විට 2012 වර්ෂයේ අඩුවීමේ ප්‍රතිශතය සියයට 51 ක් වී තිබුණි.

(ii) ලියාපදිංචි දරුවන්ගේ පසුවිපරම් තත්වය පිළිබඳව වාර්තාවක් සකස් කර නොතිබුණි.

(iii) ආබාධවලට ගොදුරු වූ ළමයින් (වයස අවුරුදු 0-18) පිළිබඳව අවශ්‍ය දත්ත රැස් කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ 2003-2012 දක්වා සේවාවන් ලබා ගත් අබාධිත සිසුන් සංඛ්‍යාව 973 ක් වන අතර, ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය බස්නාහිර පළාත තුල පිහිටුවා ඇති නිසා එම පළාතින් වැඩි දායකත්වයක් එනම් සියයට 94 ප්‍රමාණයක් සේවාවන් ලබා ඇති අතර දිස්ත්‍රික් 25 න් දිස්ත්‍රික්ක 12 ක්ම අවුරුදු 09 ක් තුල එකම ආබාධිත දරුවෙකු සඳහාවත් සේවාවන් ලබා ගෙන නොතිබුණු අතර අනෙකුත් දිස්ත්‍රික්කවලින් ද මෙම සහභාගිත්වය ඉතාමත් සුළු බව නිරීක්ෂණය විය.

(v) ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය විසින් පිලියෙල කර තිබූ පස් අවුරුදු සැලැස්මේ දක්වා තිබූ 2013 අර්ධ වාර්ෂය තුල කිරීමට සැලසුම් කර තිබූ පහත දැක්වෙන කාර්යන් මධ්‍යස්ථානය විසින් නිම කර නොතිබුණි. අපේක්ෂිත පරිදි ප්‍රතිපාදන නොලැබුණ බැවින් සැලසුම්කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ලේකම් තුමිය විසින් මා වෙත දන්වා තිබුණි.

- පෙර පාසල්වල අනෙකුත් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම්.
- අන්තර්කරණ පෙර පාසල් වලට සම්පත් ලබා දීමට මැදිහත් වීම.
- පුනරුත්ථාපන සේවා ආරම්භ කිරීම.
- උපදේශන සේවා ආරම්භ කිරීම.
- විශේෂ පුනරුත්ථාපන පෙර පාසල් ආරම්භ කිරීම.
- පෙර පාසල් නිරීක්ෂණය කර උපදෙස් ලබා දීම/ පුහුණු කිරීම
- ළමුන් විධිමත් අධ්‍යාපනයක් සඳහා යොමු කිරීමට මැදිහත් වීම තුලින් පසුහාර වැඩසටහන් හා ළමුන් යොමු කරන ලද පාසල් නිරීක්ෂණය.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

(i) **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම**

-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ක්‍රියාකාරී සැලැස්මේ හා සංයුක්ත සැලැස්මේ එක් එක් පුහුණු මධ්‍යස්ථානය මඟින් කිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව පැහැදිලිව දක්වා නොතිබුණි.
- සංයුක්ත සැලැස්මේ 2013 වර්ෂයට අදාළව ඇතුළත් කර තිබූ ක්‍රියාකාරකම් දෙකක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) **අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි කටයුතු ප්‍රමාණවත් නොවීම.**

-------------------------------------------------------------

ආබාධිතයින් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පිළිබඳව තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් පහත සඳහන් උපක්‍රම ක්‍රියාත්මක කිරීමට සංයුක්ත සැලැස්ම තුළින් අනාවරණය කර තිබුණද එම කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.

- දත්ත එකතු කිරීමේ යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තුව තුල ඒකකයක් පිහිටුවීම
- දත්ත එක්රැස් කර ගැනීමෙන් දැනුම හා කුසලතාවය ලබාදීම
- භාවිතා වන දත්ත සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඉඩකඩ ලබාදීම

## 2.8 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ ගනුදෙනු

-------------------------------------------

මනෝ වික්ෂිප්තභාවයෙන් පෙළෙන ආබාධ සහිත දරුවන් 12 දෙනෙකු වෙනුවෙන් නේවාසික සුරැකුම් නිවාසයක් පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,449,900 ක් උදපාදී නිවහන වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මනෝ වික්ෂිප්තභාවයෙන් පෙළෙන දරුවන් සඳහා නේවාසික සුරැකුම් නිවාසයක් පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, 2010 වර්ෂයේ සිට 2013 වර්ෂ දක්වා ළමුන් බඳවාගත් බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දරුවන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතු නොවූ අතර මෙම නිවාසය අධීක්ෂණය කළ බවටද තොරතුරු නොතිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) භාවිතයට නුසුදුසු වාහන 04 ක් අපහරණ කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිටි අභ්‍යාසලාභීන්ගේ පාස් පොත් 48 ක් යාවත්කාලීන කර නොතිබුණි. ඒ අය වෙත 2012 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය වෙනුවෙන් ගෙවීම සඳහා යවා තිබුණු එකතුව රු.408,265 ක් 2013 නොවැම්බර් 01 දින වන විටත් අදාළ බැංකු ගිණුම්වලට බැර කළ බවට විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) වයස අවුරුදු 18 ත් 40 ත් අතර වයසේ පසුවන ආබාධිතයන්ට වෘත්තීය පුහුණුව ස්වේච්ඡා සංවිධානයක් විසින් සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණු අතර, එම පුහුණුව වර්ෂයේ යම් කාල පරිච්ඡේදයක් තුළ සිදු කරන පරිදි ඉටු කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

(ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013 පෙබරවාරි 20 දැනැති අංක 13/0232/534/001 දරන ලිපිය ප්‍රකාරව ආබාධිත දරුවන්ගේ සුභසාධනය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර එහි ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඒ අනුව ඉතිරි ප්‍රතිපාදනය සම්බන්ධයෙන් තීරණය කිරීම යෝග්‍ය බව දක්වා තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) සීදූව වෘත්තීය පුහුණු ආයතනය සම්බන්ධයෙන් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආයතන පරිශ්‍රය අපවිත්‍රව පැවැතුණි.

(ii) ආයතනයේ නඩත්තු කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි.

(iii) ලබාදෙන අහාර පානවල අඩුපාඩු පැවැතුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 07 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 164 | 138 | 26 | - |
| (iii) | ද්විතියික මට්ටම | 491 | 438 | 53 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 92 | 76 | 16 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **757** | **660** | **98** | **01** |

=== === == ==

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 98 කගේ පුරප්පාඩු පැවතුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය** |
|---|---|---|---|---|
| (i) | සමාජ සේවා නිලධාරී | 01 | සමාජ සේවා අමාත්‍යාංශය | 2009.04.24 සිට මේ දක්වා |
| (ii) | සමාජ සංවර්ධන සහායක | 01 | සමාජ සේවා අමාත්‍යාංශය | 2012.02.02 සිට මේ දක්වා |
| (iii) | සංවර්ධන වැඩසටහන් සහායක | 01 | සමාජ සේවා අමාත්‍යාංශය | 1997.07.22 සිට මේ දක්වා |
| (iv) | රියදුරු | 01 | සමාජ සේවා අමාත්‍යාංශය | 2011.03.28 සිට මේ දක්වා |
| (v) | කාර්යාල කාර්යය සහායක | 02 | සමාජ සේවා අමාත්‍යාංශය | 2010.08.22, 2012.01.05 සිට මේ දක්වා |
| (vi) | සමාජ සේවා නිලධාරී | 03 | වැඩිහිටි ජාතික සභාව | 2010.10.02 සිට මේ දක්වා |
| (vii) | සංවර්ධන නිලධාරී | 01 | වැඩිහිටි ජාතික සභාව | 2013.11.01සිට මේ දක්වා |

**(ඇ) රාජකාරි පැවරීමේ දුර්වලතා.**

**මේ සම්බන්දයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) එක් එක් අංශවල විශේෂත්වය පිළිබඳ සළකා රාජකාරි පවරා නොතිබුණි.

(ii) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල චර්යා සටහන් ඇතුළු ලියවිලිවල අඩුපාඩු පැවතුනද, ඒ පිළිබඳ

කලින් කලට අධීක්ෂණ නිලධාරීන් විසින් සොයා බලා නිසි උපදෙස් ලබා දී නොතිබුණි.

(iii) කළමනාකරණ සහකාර සේවයේ ප්‍රමාණවත් තරම් නිලධාරීන් සිටියදී එම නිලධාරීන්ට Sigas හා Pay Roll පරිගණක වැඩසටහන් පිළිබඳව අමතර නිලධාරියෙකු බැගින් පුහුණු කිරීමට කටයුතු කර නොතිබීම නිසා එක් නිලධාරියෙකු මත රැඳී සිටීම හේතුවෙන් ස්ථාන මාරු ආදී අවස්ථාවලදී එම නිලධාරීන් පවා දුෂ්කරතාවන්වලට මුහුණ දෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) ඉටු කළ යුතු රාජකාරිය නිශ්චිතව හා පැහැදිලිව පවරා නොතිබුණි.